## ප්‍රශංසා එකතු සුපුවත
## 2018 ඔක්තෝම්බර් මස 08 වන දින සිට ඔක්තෝම්බර් මස 14 වන දින දක්වා

" විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ, ස්වාමින් වහන්සේ ඔබ සමගය"

01. ආරම්භක ගීය : පුබුදු ගී අංක 52 " පව්බර අපගේ ගැළවුම සඳහා"

02. ප්‍රශංසාව සඳහා යොමුව :-

* දෙවියන් වහන්සේ පැසසීමට, ඔවුන් වහන්සේට තුති ගී නද දෙන්නට අපි නොදනිමු. සැබවින්ම අපි ඒ සඳහා සුදුස්සෝ නොවෙමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ වැඩ වසමින් ඒ සඳහා අපව යොමු කරවන සේක. **"ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ දුර්වලකමේදී අපට ආධාර දෙන සේක. නිසි ලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ වචනවලින් කිව නොහැකි අපගේ සුසුම්ලෑම්වලදී දෙවියන් වහන්සේ අප වෙත අප වෙනුවෙන් යදින සේක."** ( රෝම 8:26 )

* පාළුකරයේදී කිතු සමිඳුන්ගේ සැබෑ අනන්‍යතාවය ඔවුන් වහන්සේට පැහැදිලිව තහවුරු කර ඉගැන්වූ ශුද්ධාත්මයාණන් වහන්සේම, අප තුළද වැඩ වසමින් අප දේවපුත්‍රභාවයට ඔසවමින් පියාණන් වහන්සේ සමග සම්බන්ධ කරන සේක. ගීතිකා, තුති ගී හා ශුද්ධ ගී වලින් දෙවිඳුන් පැසසීමට අප ගෙන යනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේමය.

* අප කළයුතුව ඇත්තේ දැනුවත්වම ආත්මයාණන් වහන්සේට අප තුළ ක්‍රියා කිරීමට ඉඩදීම පමණි. ඒ නිසා අවට පරිසරයට, සොබාදහමට, සුළඟට, නිසලතාවයට අවදිවෙමින් ශුද්ධාත්ම ස්ප්‍රීතුවෙන් මත්වෙමින් දෙවිඳුන් පසසමු.
පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ-අප සිත් සනසා...." ගීය සමගින් ප්‍රශංසාවේ ගායනයට ඇතුළු වෙමු.

03. සතියේ සුපුවත :-

* ලෝකය මැවීම දෙවියන් වහන්සේ සමගින් ශුද්ධාත්මයාණන් වහන්සේ එක්ව ඉටුකළ ක්‍රියාදාමයේ ප්‍රතිපලයකි. **" පොළව හිස්ව පාලුව තිබුණි. මහ සයුර මත මහා අන්ධකාරයක් විය. දේවාත්මානුභාවය ජලය මත හැසිරුණේය. "** (උත්පත්ති 1:2) සියල්ලේම ආරම්භකයාණෝ ශුද්ධාත්මයාණන් වහන්සේය.

* දෙව්මවුන්ට මංගලම් කීම හදිසියේ අහම්බෙන් සිදුවූවක් නොවේ. එය දෙවියන් වහන්සේ පෙර නියම කළ දේව කැමැත්ත ඉටුවීමයි. තෝරාගැනීම හා පණිවුඩය දෙවියන් වහන්සේගෙන්මය. **"සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා, දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පෙළපතින් පැවත එන, ජෝසප් නම් මනුෂ්‍යයෙකු හට විවිහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදී."** (ශු.ලූක් 1:26) පණිවුඩකරු දෙවියන් වහන්සේ අබිමුවෙහි සේවය කරන ඔවුන් වහන්සේගේම පණිවුඩකරුවෙකි. **"දෙවියන් වහන්සේ අබිමුවෙහි සේවය කරන ගාබ්‍රියෙල් මමය."** (ශු.ලූක් 1:19)

* දෙවියන් වහන්සේගේ කැමැත්ත නොපැකිලව භාර නොගැනීම දේව උදහසට ලක් වීමකි. මෝසෙස් පාළුකරයේදී ජනතාවට ජලය ලබාදීමට සිය සැරයටියෙන් ගලට වරක් ගසන ලෙසට කළ දේව නියමය කෙරෙහි සැකය හේතුවෙන් දෙවරක් ගලට ගැසීම දෙවියන් වහන්ස් ඊශ්‍රායෙල් ජනතාවට දීමට පොරොන්දු වූ කිරියෙන් පැණියෙන් උතුරන ඒ දේශය දැකීමේ භාග්‍යය ඔහුට අහිමි විය. ගාබ්‍රියෙල් දේව දූතයා ස්නාවක ජොහාන්ගේ උපත සෙකරියස් වෙත දැනුම් දීමෙදී සිය වඳ බිරියගේ වයස් තත්ත්වය හමුවේ ඒ ගැන සැක ඉපදවීම ඔහුට ඒ මොහොතේ සිට ස්නාවක ජොහාන්ගේ උපත දක්වා ගොළුවෙකු බවට පත් කරවීය.

* සොබාදහමේ නීතියට පටහැනිව පුරුෂයෙකු නොහැඳින කන්‍යාවක් ගැබ්ගැනීමට තරම් මහත් වූ විශ්වාසයක් භාග්‍යවන්ත මාතාව තුළ ජනිත කළේ ශුද්ධාත්මයාණන් වහන්සේමය. දේව දූත හඬ ශුද්ධාත්මයාණන් වහන්සේගේ හඬය. **"මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත"** (ශු.ලූක් 1:37) ඒ හඬට ගැඹුරින් අවදිව, සමාජ තත්ත්වය හමුවේ භාරගෙන පිළිතුරු දීමට දෙව්මවුන් මෙහෙය වූයේ, එවන් ගැඹුරුම ගැඹුරු හිස්බාවයක් ජනිත කළේ ශුද්ධාත්ම අනුහසිනි. **"බලන්න මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටුවේවා."**(ශු.ලූක් 1:38)
භාග්‍යවන්ත මාතාවන් තුළ සමිඳු මාංශගතවීමේ ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය තුළින් ඔබට ශුද්ධාත්මයාණන් අනාවරණය කරන දෙය කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්න.

04. සතිය පුරා

* " දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත" යන්න මේ සතිය පුරා ඔබගේ එදිනෙදා කටයුතුවලදී දැනුවත්ව ප්‍රායෝගික කරන්න. ඒ සඳහා ශුද්ධාත්මයාණන්ට අවදිවන්න.

* දේව වචනය භාර ගැනීම, අවනතවීම පහසු කාර්යයක් නොවේ. දැනුවත්වම එය භාරගෙන ප්‍රායෝගික කරන්න. ඒ සඳහා වරම්පතා යාච්ඤා කරන්න.

05. අවසන් ප්‍රශංසාව :- පුබුදු ගී අංක 137 " ඔබගේ වචනයේ දාසියයි මා....."

======================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ඔක්තෝම්බර් මස 15 වන දින සිට ඔක්තෝම්බර් මස 21 වන දින දක්වා**

**"සමිඳාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේම යයි විශ්වාස කළ තැනැත්තී භාග්‍යවන්තය.** (ශු. ලූක් 1:45)

01. * **ප්‍රශංසාවට හැඳින්වීම** :

* පුබුදු ගී අංක 07 - "සුදත් සුරිඳුනේ අප සිත් සනසා..." මෙම ගීයත් සමඟ ප්‍රශංසාවට පිවිසෙමු.

* එපීස 5:18 "අපගේ **සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ** නාමයෙන්, **දෙවි පියාණන් වහන්සේට** සැමවිටම, සැම දේ ගැනම, ස්තුති කරන්න."

මොහොතක් මේ වදන් ඉදිරියේ නවතිමු, පෙනී සිටිමු, නිශ්චලව! මේ මොහොතෙත් ඔබගේ මගේ ජීවිතයේ එකම සමිඳාණෝ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද? ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන අත්දැකීම තුළද ඔබ මා දිවි ගෙවන්නේ? වෙනත් දෙයක්, වෙනත් කෙනෙක්, වෙනත් සිද්ධියක් ද මා මෙහෙයවන්නේ?

* මේ දැන් ශුද්ධාත්මයාණන් වහන්සේට අවදි වෙමු, විවෘත වෙමු, ඉඩදෙමු. ඒ සමඟ ශුද්ධාත්මයාණන් තුළ ප්‍රශංසාවට, ශුද්ධාත්ම ගායනයට ඉඩදෙමින් ශුද්ධාත්ම වරම් දීමනා අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම.

03. දවසේ සුපුවත :

* ශු. ලූක් 1:36,37 සහ 1:39-45, 56 පොදුවේ ප්‍රකාශ කරන්න.

* කුඩා සංඝ ලෙස වෙන්වී නැවත මෙම පාඨයන් කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.

* ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාඝික කර ගනිමු.

04. අනාවරණය අයිතිකර ගනිමු :

* ශු. ලූක් 1:36,37 දේව දූතයා ප්‍රකාශ කරන මේ වදන් තුළින් දේව අම්මා දැනගත් කරුණු වන්නේ,

- තම ඥාතිවූ එලිසබෙත් මහළුව වඳ බවින් සිටියදී පුතකු පිළිසිඳ සිටින බව.
- ඒ අනුව දෙවියන් වහන්සේ සර්වබලධාරී බව, ඔවුන්වහන්සේට නොකළ හැකි කිසිවක් නැති බව.

* ශු. ලූක් 1:39-45, 56 දෙවි මවුන් දේව දූතයා තුළින් දැනගත් දෙය සමඟ එලිසබෙත් තුමියව බැහැදකින්නට ගොස් ඈ සමඟ තෙමසක් නැවතී සිටියාය. එනම් දරුවා (ස්නාවක ජොහාන්) උපත ලබන තෙක් එතුමිය එහි සිටියාය.

* දේව අම්මා වෙත අවධානය යොමු කරමු. මංගලම් කීමත් සමඟ මේ වන විට එතුමියද ගර්භනී බවට පත්ව ඇත. එලිසබෙත් තුමිය විසූ ස්ථානයට තරමක දුරක් (කිලෝ මීටර් 85ක් පමණ) තිබුණද තමන් සිටිනා තත්ත්වය ගැනවත් බිය නොවී ගත් තීරණය අපට අභියෝගාත්මක නොවන්නේද?

* ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටි දේව අම්මා එලිසබෙත් තුමියට ආචාර කරන විට, (ඔබට දෙව් පිහිටයි! යනුවෙන්...) එලිසබෙත් තුමිය ශුද්ධාත්මයණන් පූර්ණාවීම අත්දුටුවාය.

* ශු.ලූක් 1:42,43 මෙහි සඳහන් වන්නේ "සාන්ත ප්‍රසාද පූර්ණා වන්තියනි, දේව මෑණියනි,.." යන අනාවරණයයි.

* ශු. ලූක් 1:45 විශ්වාසයේ අම්මා ද, භාග්‍යවන්ත අම්මා ද, දෙව් මවුන්ම වන්නේය.

05. **අප දෙසට :** (කුඩා සංඝ තුළ සාංඝික කර ගන්න.)

* දෙව් පියාණන් වහන්සේ තුළ දේව අම්මා මෙන් 'රැඳෙන' 'යැපෙන' ජීවිත ගමනකද අප යෙදෙන්නේ?

* අන් අයට සාංඝික වීමට අවස්ථා ලැබෙන විට ඊට ඔබ පිළිතුරු දෙන්නේ කෙළෙසද? උදා: අන් අයගේ අවශ්‍යතා සඳහා යාච්ඤා කිරීමට, අන් අය වෙනුවන් වගකීමක් ගැනීමට කැඳවීමක් ලැබෙන විට...

* පස්දෙනාගේ කුඩා සංඝය, සාංඝික පවුල් දිනය, අර්ධ රාත්‍රී / සර්ව රාත්‍රී යාච්ඤා මෙහෙයයන්, අංශය හැටියට එකතුවන අවස්ථා (මව් / පිය / තරුණ / තරුණි / සුමැදි / සුරැඳි / යුවල් ... එකතු) වලට සාංඝික වීම කෙළෙසද? සහභාගිත්වය දුර්වල නම්, ගතයුතු තීරණය කුමක්ද?

06. **අවසන් ප්‍රශංසාව :**

* 'දෙව් මවුන් මෙන් වන්නට' බලය පතා එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු.

* පුබුදු ගී අංක 229 - "හදවත මගෙ සමිඳුන්ගේ ගුණ පසසන්නේ....."

======================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ඔක්තෝම්බර් මස 22 වන දින සිට ඔක්තෝම්බර් මස 28 වන දින දක්වා**

**"මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න"**

(ශු.ජොහාන් 2:5)

01. ප්‍රශංසාව සඳහා :

* නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය.

* මේ මොහොත, මේ පැය දෙවියන් වහන්සේගේ ආදරයේ පොරොන්දුව (ශු.මාක් 1:15) අප තුළ ඉටුවන අත්දකින පැයයි, මොහොතයි. පූර්ණ අනාවරණය වන ජේසුස් වහන්සේ අප අතර ප්‍රකාශ වන පැයයි. අපි එක්සිත් වෙමින් මේ මොහොතේ අප මධ්‍යයෙහි වැඩ සිටින සමිඳාණන් වහන්සේට අපගේ නමස්කාරය පුද කරමු.

* "ජේසුස් ස්වාමිනි ආලේලූයියා ......"

* ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි අපගේ සිත් අවදි කරමින් ඔවුන් වහන්සේට ඉඩ දෙමු අපව මෙහෙයවන්නට, මගපෙන්වන්නට. ගීතමය ප්‍රශංසාව තුළ දේව ආදරයට, දේව අනාවරණයට අපගේ සිත් විවර කරමු.

02. සතියේ සුපුවත : ශු.ජොහාන් 2:1-5 (කානාහි සරණ මංගල්‍යය)

මෙම සුවිශේෂ වාක්‍ය කියවා පහත සඳහන් කාරණා මුල් කරගෙන ප්‍රශංසා එකතුව තුළ ඔබට දැනෙන දේ කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න.

(අ) ජේසුස් වහන්සේගේ මෑණියෝද, ජේසුස් වහන්සේ ද සිය ශ්‍රාවකයන් සමග විවාහ මංගල්‍යයට සහභාගි වීම සාමාන්‍ය සිදුවීමක්ද?

(ආ) "මාගේ මොහොත තවම පැමිණ නැතැ"යි, සිය මෑණියන්ට ප්‍රකාශ කළද, එතුමියගේ ඉල්ලීම ජේසුස් වහන්සේ ඉටු කළ සේක.

(ඇ) "මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්න" භාග්‍යවන්ත අම්මා පැවසූ මෙම වදන් තුළින් එතුමියගේ අභ්‍යන්තරය දකින්න.

03. වචනයේ සේවකයා සඳහා :

(අ) සිදුවූ සියල්ල දේව සැලැස්ම තුළයි. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය මනා ලෙස ඉටු වීමකි. පියාණන් වහන්සේ තම පුත්‍රයාණන් මහිමයට පත් කළසේක. දේව මහිමය ප්‍රකාශ වූ පැය පැමිණියේය. එසේම ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන විවාහ ජීවිතය දේව කැඳවීමක් වුවද එමගින් දේව සැලැස්මක් ඉටුවන බැවින් විවාහ ජීවිතය ආශිර්වාදී තත්ත්වයක් කරා ඔසවනු ලැබීය.

(ආ) පියාණන් වහන්සේ තම පුත්‍රයාණන් මහිමයට පත් කරනු ලැබුවේ සිය මෑණියන් මගිනි. භාග්‍යවන්ත අම්මා තම පුතණුවන් කෙරෙහි තැබූ විශ්වාසය බලාපොරොත්තුව, ප්‍රේමය නමැති ධර්මතාවයන් කරණ කොට ගෙන මහිමයේ පැය උදා විය. දීනතාවයෙන් පෙලෙන්නන් හට දෙවියන් වහන්සේගේ දයාව, කරුණාව හිමිවන බව එතුමිය දැන සිටියාය. දෙවියන් වහන්සේගේ මාතෘක ප්‍රේමය පිළිබඳව එතුමිය තුළ වූයේ ගැඹුරු අත්දැකීමකි.

(ඇ) "මෙතුමාණන් ඔබට කියන ඕනෑම දෙයක් කරන්න..." ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර මල්ඵල ගැන්වෙනු දැකීම සිය මෑණියන්ගේ හදවතේ තිබූ පිපාසයයි. අළුත් මිදි යුෂ අති මිහිරි වූ, අති ප්‍රනීත වූ ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට අවැසි සුභාරංචියේ සළකුණකි.

* භාග්‍යවන්ත අම්මාද එදින කානා නුවර විවාහ මංගල උත්සවයේදී ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රතිහාර්ය මගින් ධර්මදූත මෙහෙවරක් ඉටු කළාසේය.
* එතුමිය එසේ පැවසුවේ ඕතුමියගේ අභ්‍යන්තර අත්දැකීම පදනම් කරගෙන නොවේද?
* දේව කැමැත්ත ඉටු කිරීම මගින් නොසිතූ අයුරින් දේව ආශිර්වාදය භුක්ති විඳීමේ භාග්‍යය උදාවනු ඇත.

04.සතිය පුරා ප්‍රායෝගික වෙමු:

* දුබලකම්, අසරණතාවයන් අත්දකින විට වැඩි වැඩියෙන් දේව කැමැත්ත සොයමු. මන්ද එමගින් පෙළහර පෑමට සමිඳාණන් මඟක් සොයනු ඇත.

* පවුල තුළ, සංඝය තුළ, සමාජය තුළ නිරතුරුවම වචනයට විවෘතව සිටිමු.

05. අවසාන යැදුම:

* ක්‍රිස්තියානි ජීවිතයේ මූලික අරමුණ වන සුභ අස්න සඳහා සාක්ෂි දැරීමට අවශ්‍ය බලය පතා යාච්ඤා කරමු.

* පුබුදු ගී අංක 381 (නව මුද්‍රණය) පුබුදු ගී අංක 356 (පැරණි මුද්‍රණය)

"වඩිනු මැනවි මැවුම්කරු වූ සුදතුනි....."

=======================

**ප්‍රශංසා එකතු සුසුවත**

**2018 ඔක්තෝම්බර් මස 29 වන දින සිට නොවැම්බර් මස 03 වන දින දක්වා**

" පූර්ණ ශුද්ධාත්ම මෙහෙයවීමට නතු වූ භාග්‍යවන්ත අම්මා "

01. ආරම්භක ප්‍රහංසාව :- පුබුදු ගී අංක 05 " ඥාන වීර්ය.........."

02. ප්‍රශංසාවට යොමුව :-

**"අපේ පියවරුන්ගේ දෙවිඳුනී, ඔබ තම වචනයෙන් සියල්ල මවා වදාළ සේක. ඔබෙන් පැමිණි මැවිලි පාලනය කරන පිණිසත්, සැදැහැවත්කමින් හා සාධාරණකමින් ලොව පාලනය කරන පිණිසත්, අවංක ලෙස බලය මෙහෙයවන පිණිසත්, ඔබ ප්‍රඥාව මඟින් මිනිසා පිළියෙල කළ සේක"** ( සලමොන්ගේ ප්‍රඥාව 9:1-3 )

සිය වචනයෙන් සකල විශ්වය මවා වදාළ මහෝත්තමයාණන් වහන්සේ තම හුස්මෙන් මනුෂ්‍යා මවා වදාළ සේක. සර්ව බල පරාක්‍රම, අතී මහිමාන්විත වූ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමේ වරය ලත් කැඳවනු ලැබූ, තෝරාගත් පිබිදුනු කිතුනු ජනතාවක් ලෙස අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වන්නට සූදානම් වෙමු.
පුබුදු ගී අංක 135 " සකල මැවිල්ලට.........."

03. දවසේ සුපුවත :- **"පූර්ණ ශුද්ධාත්ම මෙහෙයවීමට නතු වූ භාග්‍යවන්ත අම්මා"**

* ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ මෙලොවට බිහිවීමේ වරප්‍රසාදය ලැබීම භාග්‍යවන්ත මාතාවන් ශුද්ධාත්ම මෙහෙයවීම තුළ ජීවත්වීමේ වරය ලැබීමක් නොවේද?

* ජුදා සමාජයේ සෑම තරුණියක්ම අපේක්ෂාවෙන් සිටි ලෝක ගැලවුම්කරුවාණන් තම කුසින් බිහිකරන්නට ආශිර්වාදය ලබීමම ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය එතුමිය තුළ සිදුවීමක්ම නොවේද?

* පසුගිය සති කිහිපය පුරාම අප මෙනෙහි කරන්නට යෙදුනු එතුමියගේ මුළු ජීවිතයම ශුද්ධාත්ම මෙහෙයවීමට ඉඩදුන්, දේව වචනය තුළම ජීවත්වීමේ පිපාසයන් යුතුව ජීවත් වූ, එසේම තමන් තුළ සිදු වන තමන් විසින් සිදුකරන සෑම ක්‍රියාවකදීම ශුද්ධාත්මයාණන්ට අවදිවීමේ ජීවතයක් ගතකළ දේව මාතාවන්ගේ ජීවිතය විශ්මයකි. පුදුමයකි. එතුමියගේ මුවින් නික්මුනු වචන, සිනහව, බැල්ම, ප්‍රතිචාර සාමාන්‍ය මිනිස් දුවකගෙන් නික්මෙන්නක් නොවන බව සැබෑවකි. මොහොතකදී නිහඬ බව, තවත් මොහොතකදී බලාසිටීම, ඉඩදීම එසේම උදාන ගීයෙන් දිස්වෙන එතුමියගේ ප්‍රඥාව ඉතා උසස්ය.

* කුරුස පාමුල එතුමිය පසුකළා වූ අසීරු මොහොත, වේදනාත්මක පැය, කඨෝර වූ නිමේෂය ජේසු සමිඳුන් කුරුසියේ මරණය තුළ විදි වේදනාවම විඳින්නට සිදුවූ මොහොතක් මෙන්ය. ඒ අන්ධකාර පැයේදී අප සමිඳාණන් පූර්ණව පියාණන්වහන්සේට අයිති වූවා සේ දේව අම්මාද පියාණන් වහන්සේ කෙරෙහිම විශ්වාස කරමින් උත්ථානය කෙරෙහි බලාපොරොත්තුවෙන් පසුවූයේ ශුද්ධාත්ම මෙහෙයවීමට නතුවූ අත්දැකීමේ බලයෙන් නොවේද?

* ගැළවීමේ කාර්යයට සෘජුවම දායක වූ භාග්‍යවන්ත අම්මා සහය ගැලවුම්කාරීය ලෙස සභා මාතාව අගයන්නීය. එමෙන්නම සාන්ත සභාවේ මාතාවද ඕ තුමියයි. මෙවැනි ආශිර්වාදයක් ලබන්නට හැකියාව ලද භාග්‍යවන්ත මෑණියන්ගේ මුළු ජීවිතයම ශුද්ධාත්ම මෙහෙයවීමට ඉඩදුන්, දේව වචනය තුළ ජීවත් වූ, ජීවිත පැවැත්මකින් පරිපූර්ණ බව අපට පෙනේ.

04. සාකච්චාව සඳහා : ළඟ සිටින කෙනෙකු සමග බෙදාගන්න.

**i** භාගයවන්ත අම්මාගේ මාතෘක රැකවරණය තුළ, ශුද්ධ වූ සභා මාතාවගේ මැදිහත්කම තුළ , ක්‍රිස්තු ශ්‍රාවකත්වයට සාක්ෂි දරන්නට වරම්ලත් අපේ ජීවිත තුළ,

* අප කොතෙක් ශුද්ධාත්ම මෙහෙයවීමට ඉඩ දෙනවාද?
* දේව වචනය කෙරෙහි අප තුළ ඇති අවදිවීම පිපාසය කෙතෙක්ද?
* ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීමේ ජීවිතයකට අප ඇතුළු වී සිටිද?

05. ප්‍රායෝගිකව :-

**i** එදිනෙදා ජිවිතයේදී අප මුහුනදෙන විවිධ සිදුවීම්වලදී භාග්‍යවන්ත අම්මා මෙන් ශුද්ධාත්මයාණන්ට අවදිවෙමු.
**ii** මා තුළ ක්‍රියා කරන, මාව මෙහෙය වන ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙමු.
**iii** දේව වචනය ජිවිතයේ ආහාරයක් කරගන්නට පිපාසිත වෙමු. වචනය තුළ අනාවරණයවන ජේසු සමිඳාණන්ගේ හඬ හදුනා ගනිමු.

06. අවසාන ප්‍රශංසාව : පුබුදු ගී අංක 303 " දහසක් වද දී......"

**************************